# හිම බිමේ සුදු රෝස 12

විද්‍යානි මනතුංග



මෙතෙක් කතාව

උසස් අධ්‍යාපනය හමාර කිරීමෙන් පසු පර්ත් වලින් පිටත්ව යන ලහිරු නැවත වරක් පර්ත් පැමිනෙන්නේ ටානයා පිළිබඳව හදවතට දැනීයන නුපුරුදු ආදරයක ස්පර්ශයක් නිසාය. නමුත් ඇගේ ආදරයේ හිමිකරු තමා නොව මහේලය යන්න දුක්බර ලෙස හෙලිදරව් කරගැනීමකින් පසුව, නැවත මව්බිම කරා යන ලහිරු ධෛර්යයෙන් යුතුව ජීවිතයට මුහුණ දීමට උත්සාය දරයි. ඒ අතරතුර හදිසියේම වෙනත් කෙනෙකු සමඟ මහේලගේ සිදුවන විවාහය නිසා නොසන්සුන් බවට පත්වන ඔහු ටානයා පිළිබඳව විමසිලිමත්වේ.

අද එතැන් සිට....

-ටානය ගැන..." මම පුදුම වුණෙමි.

-ඔව් පුතා... ටානයා කාලයක් තිස්සෙ මහේල ගැන දුක් වුණා... පුතා නොකිව්වට එදා ඔයා මහේලගෙ ටෙලිෆොන් නම්බර් එක කලබලේ හොයපු එක ගැන මම සැක කළා..."

-සේරටම ඉස්සෙල්ල කියන්න අම්ම කොහොම ද දන්නෙ කියල ටානයා මහේල ගැන දුක් වුණ බව..."

-ටානයා මට කතා කළා... එහෙම නැත්නම් මම එයාට කතා කළා...."

-හොඳයි මට තේරෙනව... ඉතින් කියන්න අම්ම සැක කළ තැන ඉඳන්...."

-මට සැක හිතුනෙ පුතාට මේ ගැන යමක් ආරංචි වෙලා ද කියල... පස්සෙ හොයල බැලුවහම මම දැනගත්ත මහේලගෙ වෙඩින් එක ගැන.... ඊට පස්සෙ පුතාට හිතුන ටිකම මටත් හිතුන... ටානයගෙ හදවත මලක් වගේ එකක්. ඒ හදවතින් කිසිදවසක කිසි කෙනෙක් ගැන වරදක් හිතල නැතිව ඇති..."

මට ඒ වචනවල සංවේදී බව දරා සිටිය නොහැකි විය. තේ කෝප්පය දෙඅත්ලට තදකර ගත් මම බිම බලාගතිමි. ඈ දිගට ම කතා කරයි. ටානයා වෙනුවෙන් අවංකවම උපන් සංවේගයකින් ඒ හදවත පිරී ඇත.

-මම ඒ නිසා ම ගිය සතියේ ටානයාට කතා කළා..."

-ඉතින්..." මට දැනගැනීමට අවශ්‍යව ඇත්තේ ද එයයි.

-ඉතින් පුතා... ටානයා මේ ගැන මුකුත්ම දන්නෙ නැහැ තවමත්..."

මම හුන් තැනින් නැගි සිටියෙමි. කෝප්පය මේසය මතට දැමුවේ තදිනි. මම කුස්සිය දෙපසට කිහිපවරක් ඇවිද්දෙමි. එහෙත් තවමත් මගේ සිතිවිලි පාලනය කර ගැනීමට අපොහොසත් බවක් දැනේ. මම ඉදිරිපස දොරටුවෙන් පිටවී පාර දෙසට ඇවිද ගියෙමි. අම්මා මා නවත්වන්නට තැත් කළේවත්, කිසිවක් කීවේවත් නැත. මා විනාඩි කිහිපයක් එසේ ඇවිදින්නට ඇත. පරිසරයට ඒ වන විට මදින්මද අඳුර එක්වෙමින් පැවතුනි. කොට කලිසමත් ටී ෂර්ටයත් පමණක් හැඳ සිටි මට පරිසරයේ තිබූ සීතල දැනුනේවත් නැත. පසුපසින් වාහනයක හඬ ඇසුණ ද මා හැරී බැලුවේ නැත. පාරේ තව ටිකක් අයිනට වී එයට පසුකර යෑමට ඉඩ සලසා දුන් මම ඉදිරියට ම ඇවිද ගියෙමි. වාහනය මා පසුකර තරමක් දුරට ගොස් නවත්වන ලදී. ඒ තාත්තාය. ඔහු වාහනය නවතා වම් පස දොර විවෘත කර මා එන තෙක් එහි රැඳී සිටියේය. අම්මා තාත්තාට කතා කරන්නට ඇත. මම කිසිවක්ම නොකියා විවෘත කර තිබූ දොරෙන් රියට ගොඩවීමි. තාත්තා මා දෙස හැරී බැලුවේවත් කිසිවක් ඇසුවේවත් නැත. රිය ආපසු හරවාගෙන මද දුරක් එන ගමනේ දී ඉදිරිය බලාගත්වනම ඔහු නිහඬතාවය බිඳදමන ලදී.

-අම්ම මට කෝල් කරල කිව්ව, පුතා පහල පැත්තට ඇවිදින්න ගියා කියල..." මා කිසිවක් කීවේ නැත.

-පුතා කැමැති නම් අපි ටිකක් තව පාර දිගේ ම යමුද?... නැත්නම් ගෙදර යමු ද?"

-ගෙදර යමු තාත්ත..."

ඒ වන විට හදවතට නැඟී ආ ආවේගය නිවී ගොස් තිබිණි. ගෙදර යනතෙක් තාත්තා ඊටවඩා කිසිවක් කියන්නට ගියේ නැත. එහෙත් අම්මා කෑමට කතාකරනු තුරුත් තාත්තා දිගට ම මා සමඟ රැඳී සිටියේය. මගේ ජීවිතයේ ප්‍රථම වතාවට මොනයම් හෝ තරුණියක් කෙරෙහි මා තුළ වන සැලකිල්ල දෙමාපියන්ට හෙළිදරව් කරන ලද්දේ අදය. කුමන ආකාරයට එය ඔවුන් තේරුම් ගත්ත ද මට ඒ ගැන ප්‍රශ්නයක් නැත.

කිසිවෙකු එය තේරුම් ගන්නා ආකාරය පිළිබඳව සැලකිලිමත් වීමට තරම් නැවුම් හෝ උද්වේගකර බවක් මගේ හදවතත්, සිතිවිලිත් හා සමඟ පමණක් බැඳී පවතින ඒ ආදරය සතුව නැත යැයි මම සිතමි. මා මෙන්ම මගේ ආදරයද අද පැරණිවී ඇත්තකි. ඒ පිළිබඳ නිවැරදි වටහා ගැනීමක් කාට කුමන ආකාරයකින් වැදගත් වේ දැයි මම නොදන්නා නිසාම, එය රහසක් කරගැනීම හෝ කියාපෑම හෝ යන කරුණු දෙක අතරින් මම වඩාත් සැලකිලිමත් වියයුත්තේ කුමක් ගැනද යැයි පැහැදිලිතාවක්ද මට නොමැත. නැතහොත්, අද මේ අවස්ථාවේ මම හිමිකරගෙන සිටින අරුම පුදුම මානසික තත්වය දෙස බලනවිට එවැනි කරුණුත් එතරම් බරපතල යැයි මට නොදැනීයාම ගැනද මම පුදුම නොවිය යුතුය.

අපි තිදෙනා වෙනදාට වඩා බොහෝ නිහඬව කෑම ගත්තෙමු. තාත්තා වරින් වර කෙටි වැකියකින් අප අතර නිහඬතාවය බිඳින්නට තැත් කරයි. නමුත් ඔවුන් දෙදෙනාම සිටින්නේ මා කතාකරන තුරුය. මම මට අවශ්‍යව ඇත්තේ කුමක්දැයි කෙලින්ම කතාකිරීම සුදුසු යැයි සිතා සිටියෙමි.

-අම්ම... මට පුළුවන් තරම් ඉක්මනට පර්ත් යන්න ඕනැ..."

-අපි හෙටම බලමු ටිකට් එකක් බුක් කරන්න..." ඊට පිළිතුරු දුන්නේ තාත්තාය. මොහොතක් නිහඬව සිට තාත්තාම නැවත කතා කරයි.

-පුතා කැමැති නම්, මමත් එන්නම් යන්න..."

-එපා තාත්ත මම තනියම යන්නම්..."

-හොඳයි පුතා. පුතාගෙ කැමැත්තක්..."

-තාත්ත පීටර් අන්කල්ට මගේ ගමන ගැන කියන්න එපා... මම එහෙ ගියහම සුදුසු විදිහක් බලල අංකල්ට කතා කරන්නම්..."

-හරි පුතා... පුතා එපා කියනව නම් මම කතා නොකර ඉන්නම් පීටර්ට..."

-පුතා මොනව හරි උදව්වකට තාත්තටවත් මටවත් කතා නොකර ඉන්න එපා..." එසේ කියන අතර අම්මාගේ දෑසින් කඳුළු ගලා හැලෙනවා මම දුටිමි. තාත්තාවත්, මම වත් ඒ ගැන ඈට යමක් කියන්නට නොගියෙමු. ඈ නිකම්ම කඳුළු සලන තැනැත්තියක් නොවන්නේය. ඇගේ මේ කඳුළු මා වෙනුවෙන් පමණක් නොව ටානයා ද වෙනුවෙන් බව මම දනිමි. එහෙත් ඇගේ හෝ තාත්තාගේ හෝ සිතිවිලි ටානයාත් මාත් මුල්කොට කුමන අරමුණක් වටා රැඳී ඇත්දැයි යන්න ගැන පැහැදිලි හැඟීමක් මා වෙත නොවුනා මෙන්ම මට ඒ පිළිබඳව සිතිවිලි මෙහෙයවීමටද උවමනාවක් නොවුනි.

හැකි ඉක්මනින් පර්ත් යාමට මට අවශ්‍ය වුව ද ඒ වෙනුවෙන් වීසා පිළියෙල කරගැනීම සඳහා සති දෙකක් පමණ ගතවිය. මා සිටියේ නොඉවසිල්ලෙනි. රැකියා ස්ථානයට කතාකර ඉතාම හදිසි කාරණයකට සති කිහිපයක් නිවාඩු අවශ්‍ය යැයි දැනුවූයෙමි. ඔවුන් නිවාඩු දුන්න ද